# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,371 - 2024 පෙබරවාරි මස 09 වැනි සිකුරාදා - 2024.02.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 38 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 මාර්තු 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 පෙබරවාරි මස 16 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


37 - B 082539 — 353 (2024/02)
D 1 -

# පිස්කල් විකිණීම්

## කැස්බෑව දිසා අධිකරණයේ දී ය

### පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (සංශෝධිත) යටතේ සහ ඒ ප්‍රකාර වූ ඉල්ලීමක කාරණයේ දී ය.

එච්. එන්. බී. ෆිනෑන්ස් පී.එල්.සී.

(සමාගම් පනතේ VIII පරිච්ඡේදය ප්‍රකාරව ඒකාබද්ධ වීමට පෙර ප්‍රයිම් ෆයිනෑන්ස් පී.එල්.සී. යන නමින් හඳුන්වනු ලැබූ) ලියාපදිංචි සහ/හෝ ප්‍රධාන කාර්යාලය.

අංක 168, නාවල පාර, නුගේගොඩ.

............................*පැමිණිලිකරු.*

*නඩු අංකය* : DDR/805/18 (කොළඹ දිසා අධිකරණ)
*ස්වභාවය* : ණය ආපසු අයකර ගැනීම
කාර්ය පටිපාටිය : ලඝු
*වටිනාකම* : රු. 4,298,647
*ඇස්කීසි අංකය* : 22/2022 (කැස්බෑව දිසා අධිකරණ)

*එදිරිව*

01. සූර්යආරච්චිගේ දමිත් පුෂ්පකුමාර,
අංක 116/61, කටුකුරුන්ද වත්ත, මාම්පේ, පිළියන්දල.

02. දුමිඳු කණිෂ්ක සේනානායක,
අංක 199/2, අලකෙෂ්වරී රෝඩ්, ඇතුල්කෝට්ටේ, කෝට්ටේ.

03. නානායක්කාර එගොඩගේ දමින්ද අබේසේකර,
අංක 135, රන්සිරි උයන, කොරතොට, කඩුවෙල.

............................*විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ තහනමට ගන්නා ලද පහත උපලේඛනගත දේපළ විකිණීම සඳහා මා වෙත නිකුත් කර ඇති රිට් බලපත්‍රය අනුව කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ 2018/10/31 වැනි දින නෛසයි තීන්දුව හා නියත තීන්දු ප්‍රකාශය පරිදි විත්තිකරුවන් ක්‍රියා නොකිරීම මත එකී විත්තිකරුවන්ට විරුද්ධව ඇස්කීසි ගැනීමට පැමිණිල්ලට අවසර ලබා දී ඇති බැවින්,

ඒ අනුව පැමිණිල්ලට විත්තිකරුවන්ගෙන් 2018/03/23 වැනි දිනවන විට අයවිය යුතු රුපියල් හතලිස් දෙලක්ෂ අනූඅටදහස් හයසිය හතලිස් හත (රු. 4,298,647/-) ක මුදල සහ ඒ වන විට අයවිය යුතුව තිබූ වාරික මුදල්වල එකතුවවන රුපියල් දෙලක්ෂ හැටදෙදහස් හාරසිය විස්ස (රු. 262,420/-) සඳහා 2018/03/24 දින සිට වසරකට 23% බැගින් වූ අනුපාතය යටතේ පොලියක් ද, සහ ඇස්කීසි ගාස්තු පැමිණිල්ලට අයකරවා ගැනීමට පහත උපලේඛනයේ දැක්වෙන දේපල සිවිල් නඩු විධාන සංග්‍රහයේ ප්‍රතිපාදන සලස්වා ඇති පරිදි තහනමට ගැනීමෙන් පසු එකී ප්‍රතිපාදන ප්‍රකාරව කොළඹ දිසා අධිකරණය මගින් අනුමත කරනු ලබන විකුණුම් කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

එකී නියත තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී සහ පැහැර හැර ඇති හෙයින් කොළඹ දිසා අධිකරණය මගින් මා වෙත නිකුත් කර ඇති රිට් බලපත්‍රය අනුව පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2024ක් වූ මාර්තු මස 18 වැනි දින පෙ. ව. 10.30ට,**

උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි අංක 101/33, මිහිඳුපුර පාරේ, පෙලෙන්වත්ත යන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ පෙලෙන්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොට්ඨාස අංක 08 හි වරිපනම් අංක 101/033, මිහිඳුපුර පාරේ, පෙලෙන්වත්ත ගමේ පිහිටි වල්ගොන්නගහවත්ත *හෙවත්* වල්ගොන්නඹිවිට සහ හෙදවකගහවත්ත *හෙවත්* හෙදවකගහඹිවිට *හෙවත්* හෙදවකගහහේන නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. එස්. අලහකෝන් විසින් 2007 නොවැම්බර් 30 වැනි දින පිළියෙල කරන ලද අංක 5668A දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් D 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් 1988 නොවැම්බර් මස 2 වැනි දින පිළියෙල කරන ලද අංක 3836 දරන පිඹුරේ ලොට් D හි උපබෙදුමක් වන) මායිම් වශයෙන් උතුරටඃ වීරකෝන් බණ්ඩාරගේ ඉඩම මගින් ද, නැගෙනහිරට : ජී. ඩී. පියසීලිගේ ඉඩම මගින්, දකුණට : ලොට් D 2 ලකුණු කරන ලද ඉඩම මගින් ද, බස්නාහිරට : අඩි 12 පළල පාර වෙන් කිරීම මගින් ද මායිම් වූ අංක 5668A දරන පිඹුර ප්‍රකාරව පර්චස් හය (පර්. 06) ක විශාලත්වයෙන් වූ ඉඩමවන මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්තිරු ඉදිරියට ගෙන යන ලද C 311/46 යටතේ ලියාපදිංචි කර ඇත.

ප්‍රවේශය, පිටවීම ප්‍රතිගමන ගමන්මගේ සම්පූර්ණ නිදහස් අයිතිය, අවසරය සහ බලය ඇති සහ වාහන ඇතිව හෝ නැතිව හෝ බර පටවන ලද සතුන් හෝ බර පටවා නොමැතිව මාර්ගය සහ විදුලි කේබල් අතුරා පිහිටුවීමට ඇති අයිතිය, උඩ පිහිටි කම්බි කණු කානු ජල සේවය මලපවාහන නල සහ පහත සවිස්තරව විස්තර කරන ලද අංක 3836 දරන පිඹුරේ දැක්වෙන ලොට් E දිගේ යටින් සහ මතින් සමාන අයිතිය ඇති අනෙකුත් සියලුම පොදු සැලසීම් සහ පහසුකම් සමග වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ පෙලෙන්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, පෙලෙන්වත්ත ගමේ පිහිටි වල්ගොන්නගහවත්ත *හෙවත්* වල්ගොන්නඹිවිට සහ හෙදවකගහවත්ත *හෙවත්* හෙදවකගහඹිවිට *හෙවත්* හෙදවකගහහේන නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් 1988 නොවැම්බර් මස 02 වැනි දින පිළියෙල කරන ලද අංක 3836 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් E වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු ඩී. ඩබ්. අබේසිංහ විසින් 1982 දෙසැම්බර් මස 09 වැනි දින පිළියෙල කරන ලද අංක 1102 දරන පිඹුරේ ලොට් 1 ලකුණු කරන ලද ඉඩම් කොටස තුළින් මහයායවත්තට දිවෙන මග පෙන්වන පාරේ නැගෙනහිර දෙසට පිහිටි ඉඩම් කොටසෙ හි උපබෙදුමක්වන) මායිම් වශයෙන් උතුරට : අංක 3836 දරන පිඹුරේ ලොට් A, B සහ C මගින් ද, නැගෙනහිරටඃ ලොට් D මගින් ද, දකුණට : G. D. මාටින්ට අයිති ඉඩම මගින් ද, බස්නාහිරට : මහයාය වත්තට මග පෙන්වන පාර ද (ඇළපහල පාර) සහ ලොට් B මගින් ද, මායිම් වූ අංක 3836 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හයයි දශම අටයි බිංදුව (පර්. 6.80) ක විශාලත්වයෙන් වූ ඉඩමවන මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්තිරු C 69/30 යටතේ ලියාපදිංචි කර ඇත.

*ගෙවීම් ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

(1) ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25%ක මුදලක් (2) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය ප්‍රකාරවවන ගෙවීම් (3) රජයේ ගාස්තු හෝ පළාත් පාලන ආයතන ගාස්තු හෝ විකිණීම සම්බන්ධයෙන් වූ වෙනත් වියදම් (4) ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහක (75%) මුදල දින 30ක් ඇතුළත කොළඹ දිසා අධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතු ය.

*දේපලට පිවිසීම.-* කොළඹ සිට හොරණ මාර්ගයේ පිළියන්දල නගරයෙන් වම්පසට ඇති මහරගම පාරට හැරී යන විට මාර්ගයේ දකුණු පසට හමුවන කීල්ස් සුපිරි වෙළඳසැල පසුකර යනවිට මාර්ගයේ දකුණුපසට හමුවන කොට්ටාව පාරට හැරී කි. මී. 1ක් පමණ යනවිට මාර්ගයේ වම්පසට ඇළ පහළ පාර හමුවේ. එම පාරට හැරී මී. 500ක් පමණ යනවිට දකුණු පසට හමුවන විශාල වංගුව පසුකරනවාත් සමග දකුණු පසට හමුවන පාරට හැරී මී. 10ක් පමණ යනවිට හමුවන හතරමන් හංදියෙන් දකුණුපසට හැරී යන විට හමුවන අවසාන නිවස ලෙස මෙම විෂයගත දේපල පිහිටා ඇත.

යූ. ජී. එම්. රේණුකා,
ප්‍රධාන රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
කැස්බෑව.

වර්ෂ 2024 ක් වූ ජනවාරි මස 31 වැනි දින,
කැස්බෑව දිසා අධිකරණයේ දී ය.

02-209